# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/CPB/4/1/15-2016
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2015.12.29


**අයවැය චක්‍රලේඛ අංක: 07/2015**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා සභාපතිවරුන් සහ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්

**වියදම් දැරීම සඳහා බලය දීම 2016 අයවැය සහ රාජ්‍ය වියදම් කළමනාකරණය**

**(1) වියදම් දැරීමේ අධිකාරී බලය**

2015.12.19 වන දින පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2015 අංක 16 දරන විසර්ජන පනතෙහි සඳහන් 2016 වර්ෂයේ වියදම් දැරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(1) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව ගරු මුදල් අමාත්‍යතුමා විසින් වොරන්ට් බලපත්‍ර අත්සන් තබා ඇත.

ඒ අනුව, ගෙවීම් වවුචර්පත් හා වෙනත් ලියවිලි මත පහත සඳහන් පරිදි අදාළ අධිකාරිය සටහන් කළයුතු වේ.

(අ) 2015 අංක 4 සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය - සාමාන්‍ය පොදු සේවා සඳහා
(ආ) 2015 අංක 6 දරණ විශේෂ නීති අධිකාරී බලපත්‍රය - විශේෂ නීති කටයුතු සඳහා
(ඇ) 2015 අංක 4 දරණ අත්තිකාරම් බලපත්‍රය - අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා

## (2) රාජ්‍ය වියදම් කළමනාකරණය

2016 අයවැය ඇස්තමේන්තු මගින් සලසා ඇති පුනරාවර්තන හා මූලධන වියදම් සීමාවන් තුල එකී වියදම් කළමනාකරණය කරගැනීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් කටයුතු කළ යුතුය.

අයවැය ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායකව භාවිතා කිරීමේ අවශ්‍යතාවය සැළකිල්ලට ගනිමින් මුදල් අමාත්‍යතුමා විසින් අයවැය විවාද අවස්ථාවේදී යෝජනා කරන ලද පරිදි 2016 අයවැය ඇස්තමේන්තු වල වැය විෂය සංකේතාංක 1202 - ඉන්ධන වලින් 15% ක් හා වැය විෂය සංකේතාංක 1401 - ප්‍රවාහන වලින් 10% ක් අනිවාර්ය ඉතිරිකිරීමක් සිදුකල යුතුවේ. ඒ අනුව ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් සහ ගණන් දීමේ නිලධාරීන් විසින් එම වැය විෂයය සංකේතාංක යටතේ නියමිත ඉතිරි කිරීම් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ.

## (3) 2016 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

මහා භාණ්ඩාගාරය විසින් අදාල අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ ආයතනය/ආයතන වෙත ඉදිරියේදී දැනුම්දෙනු ඇත. අයවැය යෝජනා නිශ්චිත කාල වකවානු තුල ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතනය සමග සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් අවශ්‍ය කරන ක්‍රියාමාර්ග කඩිනමින් ආරම්භ කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

2016 අයවැය යෝජනාවලට අදාල අයවැය ප්‍රතිපාදන වැය ශීර්ෂ 240-2-2 ව්‍යාපෘතිය (පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වියදම්) යටතේ සලසා ඇත. අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන අයවැය ප්‍රතිපාදන වලට අනුව විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම සකස්කර අයවැය දෙපාර්තමේන්තුවට එවිය යුතු අතර අවශ්‍ය අයවැය ප්‍රතිපාදන ඒ අනුව නිදහස් කරනු ලැබේ. 2016 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධව වෙනම චක්‍රලේඛ උපදෙස් නිකුත් කරනු ඇත.

## (4) බැදීම් කළමනාකරණය

4.1 එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හෝ ආයතනයන් සඳහා වන 2016 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම, 2016-2018 මධ්‍යකාලීන වියදම් රාමුවට ගැලපෙන ආකාරයට සකස් කළයුතුය.

4.2 ශුන්‍ය පාදක අයවැය ප්‍රවේශය යටතේ මහා භාණ්ඩාගාරය විසින් එකිනෙක අමාත්‍යාංශය දැඩිව අධීක්ෂණයට ලක්කරන අතර, එකිනෙක අමාත්‍යාංශයේ කාර්යසාධනය පදනම් කරගෙන අරමුදල් නිදහස් කරනු ඇත. මෙයට අමතරව වියදම් සඳහා බැදීම් ඇතිකර ගැනීමට පෙර අදාල වැය විෂය සඳහා ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන පවතින බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් විසින් තහවුරු කරගත යුතුය.

4.4 මුදල් රෙගුලාසි අංක 66 යටතේ ප්‍රතිපාදන මාරුකිරීම් අත්‍යවශ්‍ය අවස්ථාවන්ට පමනක් සීමාකරනු ලබන අතර, නිසි පරිදි සාධාරණ හේතු නොදක්වන අවස්ථාවන්හිදී ප්‍රතිපාදන මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ.

## (5) අත්තිකාරම් ගිණුම් කටයුතු

අත්තිකාරම් ගිණුම් කටයුතු පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද සීමාවන් තුල කළමනාකරණය කළ යුතු අතර, කලින්කලට ඒ පිළිබඳව සමාලෝචනය කිරීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමුකල යුතුය.

(6) **පැහැදිලි කරගැනීම්**

මෙම චක්‍රලේඛය පිළිබඳව යම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වේ නම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් (දුරකථන අංක 011-2484665) වෙතින් ලබාගත හැක.

අ/කලේ - ආර්.එච්.එස්.සමරතුංග
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :

01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති